-----------------------------------------------------------------------------------------------------------------------

**හලාවත නගර සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

--------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 20 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2013 අගෝස්තු 28 දින සභාවේ සභාපති වරයාට යවා ඇත.

## 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව හලාවත නගර සභාවේ , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වල අගය ශේෂ පත්‍රය මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබු රු. 310,000 ක ආයුර්වේද බෙහෙත් තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව මුද්දර ගාස්තු හිඟ ආදායම රු. 12,806,598 ක් වුවද, මුද්දර ගාස්තු ලේඛනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු හිඟ ආදායම රු. 35,500,000 ක් විය. ඒ අනුව හිඟ මුද්දර ගාස්තු ආදායම රු.22,693,402 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පුස්තකාල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ගෙවීම් කරන ලද කළවැඩ අගය වූ රු.26,188,574 ක ප්‍රාග්ධන වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.10,925,746 ක්වූ අතර, උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 3,766,795 ක් වූයෙන් රු. 7,158,951 ක නොසැසඳු වෙනසක් අනාවරණය විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 175,733,267 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,060,148 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,930,863 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | **තථ්‍ය ආදායම්** | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|---|
| | | රු. 000‘ | රු. 000‘ | රු. 000‘ |
| (i) | වරිපනම් හා බදු | 11,610 | 8,470 | 17,591 |
| (ii) | බදුකුලී | 19,440 | 29,093 | 3,527 |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,410 | 1,261 | -- |
| (iv) | වෙනත් ආදායම් | 8,303 | 1,594 | 12,830 |

2.2.2 **වරිපනම් බදු**

----------------

වසර එකකට වැඩි කාලයක සිට හිඟ හිට තිබූ වරිපනම් බදු වටිනාකම රු . 12,634,832 ක් විය.

2.2.3 **මුද්දර ගාස්තු**

--------------

පළාත් ප්‍රධාන ලේකම් වරයාගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.34,233,854 ක් විය.

2.2.4 **වෙනත් ආදායම්**

--------------------

නගර සභා ආඥා පනතේ 164 වගන්තිය අනුව ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තාවූ හෝටලයකින් ආපන ශාලාවකින් හෝ නවාතැන්පලකින් අයකර ගතයුතු බලපත්‍ර ගාස්තුව ඊට පෙර වර්ෂයේ එම හෝටලයේ ආපනශාලාවේ හෝ නවාතැන්පළේ ලැබීම් වලින් 1% ක් නොඉක්මවිය යුතු ගාස්තුවක් වුවද, සභා බල පදේශයේ පිහිටි එවැනි හෝටල් 02 කින් සමාලෝචිත වර්ෂය තුලදී එලෙස බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි.

2.3 **අවිධිමත් ගණුදෙනු**

----------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ 7 වගන්තිය හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2002 අගෝස්තු 30 දිනැති ලිපිය අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ණය ලැබීම් වලින් එකතු කළ අගය මත බදු අය නොකල යුතු වුවද, 2009 වර්ෂයේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය වශයෙන් ලැබී තිබූ රු. 47,016,653 ක මුදල වෙනුවෙන් එකතු කල අගය මත නිමැවුම් බදු වශයෙන් රු. 5,037,498 ක් ගණනය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවා තිබුණි.

(ආ) නගර සභාවේ අනියම් හා ආදේශක සේවකයන් ලෙස සේවය කල සේවකයින් තුන්දෙනෙකු වෙනුවෙන් විශ්‍රාම වැටුප් වැන්දඹු අනත්දරු හිමිකම් ප්‍රදානය කිරිම සඳහා, අර්ථසාධක අරමුදල් සේවා කාලය විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් ලෙස සැලකීමට එම සේවකයින්ගේ

අර්ථසාධක අරමුදලේ සභාවේ දායකත්වය රු. 755,110 ක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කලයුතු වුවත්, එසේ නොකොට එම වටිනාකම සමාලෝචිත වර්ෂය තුල නගර සභා අරමුදලට බැරකර තිබුණි.

(ඈ) අර්ථසාධක අරමුදලේ සේවක දායකත්වයෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් අයකර වැන්දඹු අනත්දරු අරමුදල වෙත ගෙවීමට කටයුතු කලයුතු වුවත්, එසේ කර නොතිබු අතර, එම කොටස සම්පූර්ණයෙන් සේවකයින් වෙත ගෙවා තිබුණි.

**2..4 කොන්ත්‍රාත් පාලනය**

--------------------------

හලාවත නගර සභාවේ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකළ පුස්තකාල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ii වන හා iii වන අදියර අවසන් ගෙවීම 2012 ජුලි 10 දින සිදු කිරිමේදී කොන්ත්‍රාත්කරුට රු. 2,140,652 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබූ අතර, කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු තැන්පත් ලෙස රු.1,172,102 ක් වැඩියෙන් තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

**3. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත් පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ගබඩා පාලනය

---